රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 01/94

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994.01.03 වන දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් සභා යටතේ වන රාජ්‍ය ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රාජ්‍ය සමාගම් ප්‍රධානීන් වෙත.

<u>රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 1994</u>

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ මීළඟ සංගණනය 1994 මාර්තු මාසයේදී පැවැත්වීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් විධිවිධාන යොදනු ලැබ ඇත. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණන 1968, 1972 සහ 1976 වර්ෂ වලදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සහාය ඇතිව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ඇත. පිළිවෙලින් 1980, 1985 සහ 1990 යන වර්ෂ වලදී පැවැත්වූ මීළඟ සංගණන තුන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. 1994 වර්ෂයේදී පැවැත්වීමට බලාපොරොත්තු වන්නේ මෙම සංගණන මාලාවේ සත්වැන්නයි.

02. මෙම සංගණනයට, මධ්‍යම රජය යටතේ පවත්නා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා සහ රාජ්‍ය පෞද්ගලික සමාගම් හි ද, පළාත් සභා යටතේ පවත්නා රාජ්‍ය ආයතනයන්හිද සේවයේ නියුක්ත, ස්ථිර, අනියම්, තාවකාලික සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සෑම තරාතිරමකටම අයත් සේවකයින් ඇතුලත් විය යුතු වේ. අදාල ප්‍රශ්නාවලිය සේවා නියුක්තිකයින් විසින් පෞද්ගලිකවම සම්පූර්ණ කොට තොරතුරු සැපයිය යුතු වේ.

03. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ප්‍රශ්නාවලියේ පිටපත් අදාළ අමාත්‍යාංශය හෝ පළාත් සභාවේ සම්බන්ධීකරණ නිලධාරි මඟින් සේවා නියුක්තිකයින් වෙත සපයනු ඇත. මේ සම්බන්ධයෙන්

(I) ආයතනයේ සියලුම සේවා නියුක්තිකයින් වෙත ආකෘති පත්‍ර බෙදා දීම.
(II) සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර ඔවුන්ගෙන් ආපසු ලබා ගැනීම.
(III) සේවා නියුක්තිකයින් සියලුම දෙනා විසින් සම්පූර්ණයෙන් සහ නිවරදිව එම ආකෘති පත්‍ර පුරවා ඇත්දැයි පරීක්ෂා කොට බැලීම සහ,
(IV) සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර 1994 මාර්තු 15 දින වන විට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ආපසු එවීම, යන කරුණු සිදු කළ යුතුව ඇත.

04. මෙම සංගණනයෙන් ලබා ගන්නා දත්ත හා තොරතුරු මුළු රාජ්‍ය අංශයටත් මුළු රටටත් ප්‍රයෝජනවත් වේ. එහෙයින් ඉහත කී කාර්යයන් නිසි අයුරු ඉටු කර ගැනීමට සහ ඔබ ආයතනයේ සියලුම සේවා නියුක්තිකයින්ගේ තොරතුරු සම්පූර්ණව ලබා ගැනීමට අවශ්‍ය විධිවිධාන යෙදීමෙන්, සංගණනය සාර්ථක කර ගැනීමට සහයෝගය දක්වන ලෙස මම ඔබගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි.

අ.කලේ/වයි.බී.පුස්සෙදෙනිය
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

පිටපත් :- 1. අධ්‍යක්ෂ, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
2. ලේකම්, ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.